The Jornal of the Faculty of Humanities (JHU) (2024), Volume 32, Issue 2, 17-41
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# පාරභෞතික ප්‍රස්තුත විෂයෙහි බුදුන්වහන්සේගේ ප්‍රතිචාරය

ආචාර්ය අමිල කළුආරච්චි

## Abstract

It can be recognized from the study of the Canonical literature that He used very successful communication strategies to make others understand the profound teachings of the Buddha. A unique communication strategy used by him is identified as *'Silence'* or *'Unanswered Questions' (avyākata).* It seems to express different values both phonologically and philosophically. It is clearly evident from his sermons that the Buddha used this method to keep various false philosophical concepts away that had arisen in the contemporary philosophical society. Especially when faced with metaphysical propositions, Buddha's response was silence. It is not just silence but also the most positive answers that can be given to such questions. Ideas that go beyond the sensual experience of the physical world are called metaphysics. Many who thought deeply about the world and man descended into imaginary positions that transcended physical conditions. The tenets are self-evident in the philosophical world in the eternally questionable form. Buddhism recognizes them as metaphysical problems. ***'Sassato Loko'*** which is mentioned in several discourses such as Cūḷamāluṅ kyaputta, Vaccagotta, Poṭṭhapāda etc., is prominent among them. Concepts that have been developed as metaphysical questions in contemporary philosophical practice have developed over a long period of time in human history. Almost all those who grasped the string concepts were trying to rise above the contemporary competing intellectual stream. However, although it is neutral to have different ideas and

attitudes regarding any proposition, Buddhism rejects the adoption of them as the view of human thought.

**Keywords:** *Metaphysics, Authenticity, Philosophy, Comanication, Views*

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කර ගත් ගැඹුරු දහම අන්‍යයන්ට ද අවබෝධ කරවීම උන්වහන්සේගේ මූලික අභිප්‍රායයක් විය. නමුත් එය එතරම් පහසු කටයුත්තක් නො වන බව වටහා ගත් බුදුන් වහන්සේ ඒ සඳහා ඉතා සාර්ථක සන්නිවේදන උපක්‍රම යොදා ගනිමින් තත් කාර්යය මනාව සම්පූර්ණ කළහ. එහි දී බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද එක් සන්නිවේදන ක්‍රමෝපායයක් වූ අව්‍යාකෘතභාවය ශබ්දවිද්‍යාත්මක වශයෙනුත් දාර්ශනික වශයෙනුත් විවිධ අගයයන් ප්‍රකට කරයි. බුදුන් වහන්සේ විසින් තත් ක්‍රමෝපායය භාවිතයෙන් සමකාලීන දාර්ශනික සමාජයෙහි පැන නැගී තිබූ විවිධ සාවද්‍ය දාර්ශනික සංකල්ප ප්‍රතිබාහනය කළ අයුරු බුද්ධ දේශනාවන්ගෙන් මනාව විද්‍යමාන වේ. විශේෂයෙන් ම සමකාලීන සමාජයේ මතුව පැවැති පාරභෞතික ප්‍රශ්න විෂයෙහි බුදුරජාණන් වහන්සේගේ අව්‍යාකෘත ප්‍රතිචාරය ප්‍රකට වූයේ සාර්ථක සන්නිවේදන ක්‍රමෝපයයක් වශයෙන් සැලකෙන ඨපනීය ක්‍රමය අනුගමනය කිරීම මගිනි. එය උන්වහන්සේ සතුව පැවැති ඉතා විශිෂ්ට සන්නිවේදන ප්‍රාගුණ්‍යය විදහා දක්වෙන අවස්ථාවකි. ඒ අනුව ඉහත ප්‍රස්තුතය මගින් සාර්ථක සන්නිවේදකයකුගේ භූමිකාවේ සුසමාදර්ශයන් විදහා දක්වෙයි. මෙම පර්යේෂණය මගින් බුදුරජාණන් වහන්සේගේ අව්‍යාකෘත ප්‍රතිචාරයෙහි අන්තර්ගත සන්නිවේදන මූලධර්ම හඳුනා ගැනීමත් උන්වහන්සේගේ ධර්මය මනාව සමාජය තුළ ස්ථාපිත කිරීමේදී එකී ක්‍රමවේදය කොතෙක් දුරට ධනාත්මක බලපෑමක් ඇති කළේද යන්නත් විමසීමට භාජන කෙරේ.

## සාහිත්‍ය විමර්ශනය

*Philosophy: East and West* නම් සඟරාව මගින් ප්‍රකාශයට පත් කරන ලද, ඔර්ගන් (Organ, 1954) විසින් සිදුකළ *The Silence of the Buddha* නම් අධ්‍යයනය මගින් බුදුරදුන්ගේ ඉගැන්වීම්හි ඇතුළත්

නිශ්ශබ්දතාව පිළිබඳ සංකල්පනාවන් දෙසත් ගැඹුරු දුරවබෝධ ප්‍රස්තුත දෙසත් දාර්ශනික පැතිකඩකින් විමර්ශනය කර ඇති ආකාරයක් විද්‍යමාන වේ. නිශ්ශබ්දතාව පිළිබඳ සංකල්පයේ ගැඹුරට පිවිසීමෙන්, බෞද්ධ චින්තනයේ සහ පාරභෞතික ප්‍රස්තුතයන්හි සංකීර්ණත්වය වටහාගත හැකි බව ඔහු අවධාරණය කරයි, බුදුන් වහන්සේගේ නිශ්ශබ්දතාවයේ ප්‍රහේලිකා ස්වභාවය, යථාර්ථය සහ පැවැත්ම අවබෝධ කරගැනීම සඳහා එහි ඇඟවුම් පිළිබඳ සියුම් විශ්ලේෂණයක් හරහා, ඕර්ගන් භාෂාවේ සීමාවන් සහ පාරභෞතික ක්ෂේත්‍රය තුළ වාචික නොවන සන්නිවේදනයේ වැදගත්කම ගැන මෙනෙහි කිරීමට පාඨකයා පොලඹවා ඇත. එසේම ගැඹුරු තීක්ෂණ බුද්ධිය මගින් යථාර්ථය වෙත ළඟාවීමට අදාළ දොරටුවක් ලෙස බුදුසමයේ ඉගැන්වෙන නිශ්ශබ්දතාවයේ තේමාව හඳුන්වා දෙන ඕර්ගන් සිය කෘතිය තුළින් පාරභෞතික ප්‍රස්තුතවල ගැඹුර සහ ඒවායින් උද්ගත වන සැකසංකාවන් ගැන නවමු ආරකින් විමසීමට පාඨකයා වෙත ධනාත්මක ප්‍රේරණයක් සිදුකොට තිබේ. බුදුන් වහන්සේගේ නිශ්ශබ්දතාව දාර්ශනික සංකල්පයක් ලෙස පරීක්ෂා කිරීම මගින් පාරභෞතික වශයෙන් පවතින කරුණු විස්තර කළ නොහැකි එසේම ගැඹුරු ඇගයීමක් සිදුකළ නොහැකි ඒවා වශයෙන් හඳුන්වා දීමට මෙම කෘතිය මගින් ප්‍රයත්න දරා ඇත. සමස්තයක් වශයෙන්, බෞද්ධ දර්ශනයේ නිශ්ශබ්දතාව යන තේමාව එස්සේ සිදු කරන ලද ඕර්ගන්ගේ විමර්ශනය මගින් භාෂාව, නිශ්ශබ්දතාව සහ පාරභෞතික ආදී ක්ෂේත්‍රයන්හි ඇති සංකීර්ණ අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ චින්තනමය විප්ලවකාරී ස්වරූපයක් ඉදිරිපත් වී ඇතැයි කිව හැකි ය.

මහාචාර්ය වයි. කරුණාදාස ශූරීන් විසින් සිදුකරන ලද (කරුණාදාස, 2007) *The unanswered questions: Why were they unanswered? A re-examination of the textual data* යන ශාස්ත්‍රීය පර්යේෂණය මගින් නිර්වාණාවබෝධයට සම්බන්ධ, දාර්ශනික සංකීර්ණතා සහිත පාරභෞතික ප්‍රස්තුත පිළිබඳ බුදුසමයේ විග්‍රහය ගැඹුරුන් විශ්ලේෂණය කෙරී ඇත. මූලික සූත්‍රාගත අව්‍යාකෘත (අව්‍යාකත) කරුණු ගැඹුරින් විමර්ශනය කරබැලීමෙන්, පාරභෞතික ප්‍රස්තුතවල සූක්ෂම ස්වභාවය පැහැදිලි වන බව එමගින් මනාව පෙන්වා දී තිබේ. එසේම මූලික සූත්‍රාගත තොරතුරුවලට අනුව අව්‍යාකෘත

කරන ලද කරුණුවල ස්වභාවය නැවත නැවත පරීක්ෂා කිරීම මගින් පාරභෞතික සංකල්ප පිළිබඳ බෞද්ධ දැක්ම නිවැරදිව හඳුනාගැනීමට උපකාරී වන ආකාරය ද කතුවරයා විසින් අවධාරණය කොට ඇත. එපමණක් නොව එය බුදුසමයේ දාර්ශනික විමසුමෙහි ස්වභාවය වටහා ගැනීමට ද බෙහෙවින් ඉවහල් වන බව පෙන්වා දී ඇත. මහාචාර්ය වයි. කරුණාදාසයන්ගේ මෙම අධ්‍යයනය පාරභෞතික ප්‍රස්තුත අධ්‍යයන ක්ෂේත්‍රයට අගනා දායකත්වයක් සපයන අතර, පැරණි දාර්ශනික මත නව දැක්මක් ඔස්සේ විග්‍රහයට බඳුන් කළ හැකි ආකාරය ද විදහා දැක්වේ.

පාරභෞතික ප්‍රස්තුතයන් පිළිබඳ සයිඩරිට්ස් (Siderits, 2021) විසින් කරන ලද *How Things Are: An Introduction to Buddhist Metaphysics* නම් පර්යේෂණය මෙහි ලා වැදගත් කෘතියක් වශයෙන් සැලකිය හැකි ය. එය බෞද්ධ දර්ශනයට අනුබල දෙන පදනම් හා සංකල්ප පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයයි. එයට අමතර ව පාරභෞතික තත්ත්වයන් පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළට පිවිසීමෙන්, යථාර්ථයේ සහ විඥානයේ ස්වභාවය පිළිබඳ සියුම් අවබෝධයක් ලබා ගැනීමට හැකිවන අයුරු කතුවරයා විසින් මනාව පෙන්වා දී ඇත. අනිත්‍යතාව, ප්‍රතීත්‍යසමුප්පාදය සහ අනාත්මතාව වැනි අංශයන් ප්‍රවේසමෙන් පරීක්ෂා කිරීම හරහා, ගැඹුරු දාර්ශනික ප්‍රශ්න මෙනෙහි කිරීමට සයිඩරිට්ස් පාඨකයා මෙහෙයවයි. බෞද්ධ පාරභෞතික විද්‍යාව සහ ධර්මයන්හි පැවැත්මේ ස්වභාවය පිළිබඳ පාඨක අවබෝධය පුළුල් කිරීමට ද ඔහුගේ විග්‍රහයන් උපකාරී වේ.

කේ. එන්. ජයතිලකයන්ගේ (ජයතිලක, 2013) *Early Buddhist Theory of Knowledge* කෘතිය ඔස්සේ යථාර්ථයේ ස්වභාවය සහ පාරභෞතික ප්‍රස්තුතවල ස්වභාවය මැනවින් අවධාරණය කර ඇත. බෞද්ධ දර්ශනයේ දැක්වෙන පාරභෞතික ප්‍රස්තුත විමර්ශනය කිරීමෙන් ලබා ගන්නා වූ දැනුම යථාර්ථයේ ස්වභාවය පරිපූර්ණ වශයෙන් හඳුනා ගැනීමටත් අවබෝධය පුළුල් කරගැනීමටත් ඒ තුළින් දුකින් මිදීමේ මාර්ගය හෙළිකර ගැනීම සඳහාත් අවස්ථාවක් සැලසෙන බව පෙන්වා දෙයි.

*Journal of Indian Philosophy* මගින් ප්‍රකාශයට පත් කරන ලද *The unanswered questions and the limits of knowledge* නම්

නිකල්සන්ගේ (Nicholson, 2012) අධ්‍යයනය ඔස්සේ බුදුසමයාගත අව්‍යාකෘත ප්‍රශ්න පිළිබඳ දාර්ශනික ප්‍රවේශය අවධාරණය කෙරෙන අතර පුද්ගල අවබෝධයේ ආවේණික සංකීර්ණතා පිළිබඳ පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කෙරෙයි. පාරභෞතික ප්‍රශ්න පිළිබඳ ගැඹුරු අධ්‍යයනයන් ඔස්සේ, දැනුමේ සීමාවන් පුළුල් කරගැනීමට අවස්ථාව ඇති බව නිකල්සන් පෙන්වා දෙයි. දාර්ශනික කතිකාව තුළ පවතින අවිනිශ්චිතතාවන් ඥානවිභාගය පිළිබඳ සාම්ප්‍රදායික සංකල්පවලට අභියෝග කරන බවත් විඥානයේ ගූඪත්වය පිළිබඳ ගවේෂණය කිරීමට සූක්ෂම ප්‍රවේශයක් අනුගමනය කළයුතු බවත් පෙන්වා දෙන කතුවරයා නිශ්චිත පිළිතුරු නොමැති අව්‍යාකෘත ගැටලු විශ්ලේෂණය කරමින් දැනුමේ සීමාවන් පිළිබඳ සියුම් විග්‍රහයක් ඉදිරිපත් කරන ආකාරය ප්‍රසංසනීය ය. පාරභෞතික කරුණු හඳුනා ගැනීම මගින් ප්‍රඥාවට සහ නිර්වාණාවබෝධයට නව අරුතක් එක්කර ගැනීමේ වැදගත්කම අවධාරණය කෙරෙයි. සමස්තයක් වශයෙන්, නිකල්සන්ගේ අධ්‍යයනය, පාරභෞතික ප්‍රස්තුතවල සංකීර්ණ ස්වභාවය සහ දාර්ශනික ගවේෂණය සමඟ පවතින අභියෝග පිළිබඳ ගැඹුරු පර්යේෂණයක් ලෙස හඳුනාගත හැකි ය.

චක්මා (Chakma, 2017) විසින් සිදු කරන ලද *An explanation to the Buddha's unanswered questions* යන අධ්‍යයනය තුළින් පාරභෞතික ප්‍රස්තුතවල ස්වභාවය මැනවින් ඉස්මතු කිරීමට උත්සාහ දරා ඇත. එයට අමතර ව බෞද්ධ චින්තනයේ මුල්බැසගත් ප්‍රධාන දාර්ශනික සංකල්ප පිළිබඳ කරනු ලබන සවිස්තරාත්මක විශ්ලේෂණය මගින් පාරභෞතික අංශය ගැඹුරින් විග්‍රහයට බඳුන් කෙරෙයි. එසේ ම සංකීර්ණ පාරභෞතික සංකල්පයන් පිළිබඳ සිදුකරනු ලබන දාර්ශනික විමසුම්වල දී සහ ඒවා සමග ගනුදෙනු කිරීමේ දී ඇතිවන අභියෝගාත්මක තත්ත්වයන් ද චක්මා විසින් පැහැදිලි කොට තිබේ. බෞද්ධ ඉගැන්වීම් හි ඇතුළත් පැවැත්ම, විඥානය සහ පුද්ගල යථාර්ථයේ ස්වභාවය ආදී සංකල්පනාවන් සමග පාරභෞතික ප්‍රස්තුතයන් වටා පවතින කතිකාව සම්බන්ධ කරන ආකාරය මෙම පර්යේෂණයට ඉතා වැදගත් ශාස්ත්‍රීය අගයක් එකතු කිරීමට සමත් වී ඇත. බුදුරදුන් විසින් පිළිතුරු නොදුන් ප්‍රශ්න සහ බෞද්ධ පාරභෞතික විද්‍යාව අතර ඇති සම්බන්ධය අධ්‍යයනය කිරීමට ද පාඨකයන් පොලඹවනසුලු අදහස් රාශියක් මෙම පර්යේෂණයේ දී දැකගත හැකි ය.

ඉහත දක්වන ලද ශාස්ත්‍රීය විමර්ශනයන් මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ක්ෂෙත්‍රය හෙළි කරගැනීම සඳහා බෙහෙවින් උපකාරී වන අතර ඒ ඒ පර්යේෂණයන් හි අන්තර්ගත සංකල්ප, මතවාද, තර්ක සහ නව දැනුම් පරාශයන් පර්යේෂණ අරමුණු සාධනය කිරීම විෂයෙහි බෙහෙවින් ආධාර කොට ගත හැකි ය.

## පර්යේෂණ ගැටලුව

පුද්ගලයා හා තදනුබද්ධ බාහිර ලෝකය පිළිබඳ මිනිසාගේ විමර්ෂණාක්ෂිය යොමු වූයේ මානව පරිණාමයේ ඈත අවධියේ සිට ය. ඇතැම් විට ඒ පිළිබඳ ඉදිරිපත් වූ අදහස් කිසියම් තාර්කික මදනම් මත ස්ථාපිත වී තිබුණ ද බොහෝ අවස්ථාවන්හි දී ඒවා පාරභෞතික මෙන් ම ප්‍රබන්ධාත්මක ස්වරූපයක් ඉසිලූ බවක් දක්නට ලැබේ. නමුත් බුදුසමයේ උදාවත් සමග එබඳු ප්‍රස්තුතයන් විෂයෙහි යොමු වූ අවධානයෙහි සුවිශේෂත්වයක් ප්‍රකට වේ යැයි සිතිය හැකි ය. ඒ අනුව බුද්ධ සමකාලීන සමාජයෙහි පවා විද්‍යමානව පැවැති පාරභෞතික ප්‍රස්තුත විෂයෙහි බුද්ධ දේශනාවන්ගෙන් ඉදිරිපත් වූ ප්‍රතිචාරය කොතෙක් දුරට සාර්ථක සන්නිවේදන උපක්‍රමයක් වූයේදැයි යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණු

පාරභෞතික ප්‍රස්තුත විෂයයෙහි බුදුන්වහන්සේගේ ප්‍රතිචාරයේ ස්වභාවය අධ්‍යයනය කිරීමේ අරමුණු කිහිපයකි. අතීතයේ සිට ම මිනිසාගේ චින්තනය ක්‍රියාත්මක වූයේ හුදෙක් එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාම සඳහා අදාළ කටයුතු විෂයයෙහි පමණක් නො වේ. වර්තමානයේ මෙන් සංකීර්ණත්වයට පත් නොවූ ජීවන ක්‍රමයකට අවතීර්ණ වී සිටි ආදිකාලීන මිනිසා තුළ ද ස්වකීය පැවැත්ම මෙන් ම බාහිර ලෝකයේ පැවැත්ම සම්බන්ධයෙන් ද විවිධාකාර වූ සංකල්පනාවන් බිහි වී ඇත. ගැඹුරින් කල්පනා කිරීමේ දී ඒවා හුදු කාල්පනික මතවාද වශයෙන් සලකා බැහැර කිරීම ද කළ නො හැකි ය. මන්ද, ඒ ඒ සමාජ සංදර්භයන්හි දී ඒවා වඩාත් තදින් මිනිස් චින්තනය ආක්‍රමණය කළ හැකි බැවිනි. එනිසා මිනිසාගේ දෛනික පැවැත්මට අදාළ තත්ත්වයන් ඉක්මවා ගිය සංකල්පනාවන් බුදුසමය පාරභෞතික මතවාද වශයෙන් සැලකීමේ යුක්තියුක්තභාවය විමසීම වර්තමාන

මානව චින්තනයේ ප්‍රගමනය විෂයයෙහි ද මූලාධාර වේ. ඒ පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කිරීම මෙහි මූලික අරමුණකි. එසේ ම එබඳු මතවාද සඳහා පිළිතුරු නො සපයා බැහැර කිරීමේ ප්‍රතිපත්තිමය සන්නිවේදන උපක්‍රමයක් ද බුදුසමය භාවිත කොට ඇත. ඒ සඳහා බලපෑ දාර්ශනික හා ඥානවිභාගාත්මක පසුබිම විමසා බැලීම ද මෙම අධ්‍යයනයේ තවත් අරමුණකි. පුද්ගලයාගේ ජීවිතයේ මූලික අපේක්ෂාවන් විය යුත්තේ මොනවාදැයි යන්න බුදුසමය විග්‍රහ කරන්නේ අතීතය හා අනාගතය යන හුදු අත්දැකීමට භාජන නොවූ කාලයට ප්‍රමුඛතාව දෙමින් නොවේ. එහි දී වර්තමාන හෙවත් පුද්ගලයා මේ මොහොතේ අත්විඳිමින් සිටින කාලය ජීවිතයේ වටිනාම කාලය ලෙස සලකන බුදුසමය පුද්ගල සන්තානයේ ඇති වන ඇතැම් සංකල්පනාවන් එම වටිනාම මොහොත පුද්ගලයාගෙන් උදුරා ගැනීමට සමත් වේ. එ නිසා එබඳු සංකල්පනාවන් විෂයයෙහි අපගේ සිතුවිලි ක්‍රියාත්මක වීමට ඉඩහසර වෙන් නොකළ යුත්තේ කුමන හේතුවක් නිසාදැයි බුදුසමය ගැඹුරින් අධ්‍යයනයක යෙදෙයි. එම අධ්‍යයනය වර්තමාන තත්ත්වයන් හා ගළපමින් ඉස්මතු කොට දැක්වීම ද මෙම පර්යේෂණයේ තවත් මූලික අරමුණකි.

## පර්යේෂණයේ වැදගත්කම

මිනිසාගේ චින්තන රටාව හා බුද්ධිමය පරිපාකය ගොඩනැගෙන්නේ හුදෙක් ඔහු උපතින් ම ගෙන ආ තමන්ට ම ආවේණික දැනුම් පද්ධතියකින් ම පමණක් නොවේ. ඔහු හෝ ඇය ජීවත් වන සාමාජ පසුබිම, අධ්‍යාපනය හා අත්දැකීම් යනාදිය ද ඒ සඳහා ප්‍රබල ව බලපෑම් කරනු පෙනේ. එනිසා අතීතයේ සිට පැවත එන දැනුම් පද්ධතීන් එසේ ම පිළිනොගෙන ඒවායෙහි යෝග්‍ය අයෝග්‍යතාව මනාව තේරුම් ගැනීම වර්තමාන මිනිසාට යහපත් චින්තන රටාවක් ගොඩනගා ගැනීමට උපකාරී වේ. කෙළවරක් නොපෙනෙන මුල මැද අග හරිහැටි දැක ගැනීමට අපහසු යම් යම් අදහස් මිනිස් මනසට සිදුකරන අහිතකර බලපෑම සුළුපටු නොවේ. එබඳු අදහස් බුදුසමය පාරභෞතික සංකල්ප වශයෙන් සලකා ඇත. පාරභෞතික ප්‍රස්තුත කෙරෙහි මිනිසා දක්වන උනන්දුවේ ප්‍රමාණය කිසියම් සමාජයක තත්ත්වය තීරණය කිරීම විෂයයෙහි ද ඉවහල් වේ. නූතනයේ ඇතැම් මානව සමාජයන්හි ශීඝ්‍ර බිඳවැටීම් සඳහා

පාරභෞතික මතවාදයන්හි එල්බ ගැනීම හේතු වී තිබේ. පෙර සිට පැවත එන දැනුම පුද්ගලයාගේ අනාගත දිශානතිය තීරණය කිරීමට ඉවහල් වන්නා සේම එබඳු දැනුම් පද්ධතීන් ස්වකීය ජීවිත අභිවෘද්ධිය විෂයයෙහි භාවිත කිරීමේ දී නිවැරදි මාර්ගෝපදේශකත්වයක් නොමැති වුවහොත් මිනිසා චින්තනමය අසරණභාවයකට නතු වේ. ඒ අනුව බුදුසමය මිනිසාගේ භෞතික පැවැත්ම විධිමත් කරගැනීම විෂයෙහි අදාළ මාර්ගෝපදේශකත්වය සපයනු ලබන අතර පාරභෞතික සංකල්පනාවන් හේතුවෙන් අසංවිධානාත්මක මානසික පැවැත්මක් ඇති වීම වළක්වාලීමට කටයුතු කරයි. වර්තමානයේ ශ්‍රී ලාංකික සමාජය ද ඇතැම් පාරභෞතික සංකල්ප පදනම් කොටගෙන කිසියම් අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති අවස්ථාවක දී බුදුසමයාගත උක්ත මාර්ගෝපදේශකත්වය වඩාත් පැහැදිලිව සන්නිවේදනය කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කම ප්‍රකට වන අවස්ථාවකි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන මිශ්‍ර ක්‍රමය භාවිත වේ. පර්යේෂණ අරමුණු සාධනය කර ගැනීමේ දී සාහිත්‍යාත්මක මූලාශ්‍රය ප්‍රමුඛ වශයෙන් ආධාර කරගනු ලැබේ. එහි දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයෙන් ද (Textual Analysis) විද්‍යුත් මෘදුකාංග හා සම්මුඛ සාකච්ඡා යනාදී ප්‍රවේශයන් ඔස්සේ ද දත්ත රැස්කරනු ලබන අතර එසේ රැස්කරන දත්ත විශ්ලේෂණය කිරීම මගින් පර්යේෂණයෙන් අපේක්ෂිත සාකච්ඡාව ගොඩනගනු ලැබේ. සාකච්ඡාවෙන් මතුවන තර්ක, විතර්ක හා සිද්ධාන්ත මගින් පර්යේෂණ ප්‍රතිඵල සමාලෝචනය වීමද පර්යේෂණ ක්‍රමවේදයේ එක් අධියරක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

## දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව

භෞතික ලෝකයේ ඉන්ද්‍රියානුසාරී අනුභූතිය ඉක්මවා ගිය අදහස් පාරභෞතික නමින් හැඳින්වේ. ලෝකය හා මිනිසා පිළිබඳ ගැඹුරින් කල්පනා කළ බොහෝ දෙනා භෞතික තත්ත්වයන් ඉක්මවා ගිය කාල්පනික ස්ථාවරයන්ට බැස ගත්හ. තත් ස්ථාවරයන් දාර්ශනික ලෝකයෙහි සදාතනික ප්‍රශනාර්ථ ස්වරූපයෙන් ම ප්‍රතීයමානය. බුදුසමය ඒවා පාරභෞතික ගැටලු වශයෙන් හඳුනාගනියි. නමුත් බුදුසමය එබඳු

ප්‍රශ්න කෙරෙහි දක්වූ අව්‍යාකෘත ප්‍රතිචාරය ප්‍රශ්නාර්ථයකට වඩා වැඩි යමක් අවධාරණය කරන බව පැහැදිලි වේ. පාරභෞතික ගැට වශයෙන් හඳුනාගත හැකි කරුණු කිහිපයක් ම පිටක සාහිත්‍යයෙහි සඳහන් ව ඇත. චූලමාංඛ්‍යපුත්ත, වච්ජගොත්ත, පොට්ඨපාද වැනි සූත්‍ර කිහිපයකම සඳහන් වන *සස්සතො ලොකො* ආදී ප්‍රශ්නාවලිය එයින් ප්‍රමුඛ වේ. එම පාරභෞතික ප්‍රශ්න සූත්‍ර සාහිත්‍යයට අනුව මෙසේ දැක්විය හැකි ය (මජ්ඣිමනිකාය 2, 2006:152).

1. සස්සතෝ ලෝකෝ - ලෝකය සදාකාලික ද?
2. අසස්සතෝ ලෝකෝ - ලෝකය සදාකාලික නො වේ ද?
3. අන්තවා ලෝකෝ - ලෝකය අන්තවත් ද?
4. අනත්තවා ලෝකෝ - ලෝකය අනන්තවත් ද?
5. තං ජීවං තං සරීරං - ජීවය හා ශරීරය එකක් ද?
6. අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීරං - ජීවය හා ශරීරය අනෙකක් ද?
7. හොති තථාගතො පරම්මරණා-තථාගත (සත්ත්ව) තෙමේ මරණින් මතුත් සිටින්නේ ද?
8. න හොති තථාගතො පරම්මරණා -තථාගත (සත්ත්ව) තෙමේ මරණින් මතු නො සිටින්නේ වේ ද?
9. හොති ච න ච හොති ච තථාගතො පරම්මරණා- තථාගත (සත්ත්ව) තෙමේ මරණින් මතු සිටින්නේ ද? නොසිටින්නේ ද වේ ද?
10. නෙ ව හොති න න හොති තථාගතො පරම්මරණා- තථාගත (සත්ත්ව) තෙමේ මරණින් මතු සිටින්නේ ද නො වේ ද? නො සිටින්නේ ද නො වේ ද?

වශයෙනි. ඊට අමතර ව දුක තේමා කරගත් තවත් අධිභෞතික ගැටලු කිහිපයක් අචේලකස්සප සූත්‍රයෙහි සඳහන් වේ. ඒවා නම්,

1. දුක තමා විසින් කරන ලද්දක් ද?
2. දුක අනුන් විසින් කරන ලද්දක් ද?
3. දුක අනුන් විසින් ද තමන් විසින් ද කරන ලද්දක් ද?
4. දුක ඉබේ හට ගත්තක් ද? (සංයුත්තනිකාය 2, 2006:32)

වශයෙනි. උක්ත සියලු පාරභෞතික ප්‍රශ්න විෂයෙහි බුදුසමය දැක්වූ

ප්‍රසිද්ධ ප්‍රතිචාරය නම් නිහඬ බවයි. බුදුරජාණන් වහන්සේ තත් නිහඬ බව ප්‍රකාශ කරනු ලැබුවේ එම ප්‍රශ්න අව්‍යාකෘත කිරීමෙන් හෙවත් ඨපනීය වශයෙන් වශයෙන් බැහැර කිරීමෙනි. අව්‍යාකෘත යන්නෙන් අදහස් වන්නේ බුදුරජාණන් වහන්සේ විසින් පිළිතුරු නොදුන් ප්‍රශ්න බවක් මිස පිළිතුරු නොදත් බවක් නො වේ. නමුත් ඇතැමුන් තුළ බුදුරජාණන් වහන්සේ එබඳු ප්‍රශ්නවලට පිළිතුරු නො දී නිහඬ වීම පිළිබඳ ඇත්තේ උන්වහන්සේගේ බුද්ධඥානය හා බැඳුණු සැකයකි. එනිසා සමහරු පාරභෞතික ප්‍රශ්න පිළිතුරු නොදිය හැකි ඒවා යයි වරදවා තෝරති (විජේබණ්ඩාර සහ මොරටුවගම 1995:85).

සමකාලීන භාරතීය දාර්ශනික සන්දර්භයෙහි පාරභෞතික ප්‍රශ්න වශයෙන් ගොඩනගා ගෙන තිබූ සංකල්ප මිනිස් ඉතිහාසයේ දිගු කලක සිට සංවර්ධනය වූ ඒවා වශයෙන් හඳුනාගත හැකි ය. තත් සංකල්ප ග්‍රහණය කරගෙන සිටියවුන් බලාපොරොත්තු වූයේ සැබැවට ම සත්‍යය පසක් කිරීම ද නැතහොත් සමකාලීන තරගකාරී බුද්ධිප්‍රවාහයෙහි සත්‍යය පසක් කළ ප්‍රාඥයින් මෙන් කැපී පෙනීම දැයි යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් ඕනෑ ම ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් විවිධ අදහස්, ආකල්ප ඇති විය හැකි වුවත් එම සංකල්පයන් මිනිස් චින්තනයේ ආවශ්‍යක සීමා සමතික්‍රමණය කරමින් දෘෂ්ටි වශයෙන් අභිනිවේස කිරීම බුදුසමයෙන් ප්‍රතික්ෂේප කොට ඇත.

කිසියම් මතවාදයක එල්බ ගැනීම මිනිසාගේ සාමාන්‍ය ස්වභාවය යි. එසේ ම මතවාදයක් මානසික ව ස්පර්ශ කිරීම යනු එහි යන්තමින් ගැවී සිටීම නො ව එම මතවාදය දැඩි ව ගැනීම හෙවත් එහි පතුලට ම කිඳා බැසීම යි. දිට්ඨිඅභිනිවේස යනුවෙන් ගැනෙන්නේ මෙය යි (අබේනායක 2009:357). පාරභෞතික ප්‍රශ්න මගින් ද ප්‍රකට වන්නේ අභිනිවේෂයකි. ඒවා ඉදිරිපත් කළ අය දැඩි දෘෂ්ටිග්‍රාහීන් වූහ. බුදුසමය කිසිදු අයුරකින් දෘෂ්ටිගතිකත්වයකට නො වැටෙයි. බුදුරදුන්ගේ දේශනාවන් මධ්‍ය මාර්ගයක් ඔස්සේ ස්ථාපිත වී තිබීම එය මැනවින් ප්‍රකට කරයි (සංයුත්තනිකාය 2, 2006:28). දෘෂ්ටීන්ට එළඹීම අන්තග්‍රාහිත්වයට යොමු කරවන අතර එමගින් යථාර්ථය මුවා කරනු ලැබේ. සැම විට ම දෘෂ්ටීන්ට නො එළඹ කටයුතු කිරීම බුදුසමය අගය කරන්නේ එහෙයිනි (ඛුද්දකනිකාය 2, 2006:46). බුද්ධ දේශනාව අනුව එය ආචාරවිද්‍යාත්මක පදනමකින් පමණක් නො ව ඥානවිභාගීය වශයෙන් ද මූලික සිද්ධාන්තයක් වශයෙන් සැලකිය හැකි ය.

කෙසේ වෙතත් සමකාලීන ව පැනනැගී තිබූ සමය සමයාන්තරයන්හි පාරභෞතික ප්‍රශ්න සඳහා දාර්ශනික වශයෙන් ලබා දී තිබුණේ ප්‍රමුඛස්ථානයකි. තත් ප්‍රස්තුත විෂයයෙහි විසඳුම් සොයා යෑම ඥානවිභාගීය වශයෙන් වැදගත් කොට සැලකූ පිරිස් ඒවා සනාථ කරනු පිණිස විවිධ වාද පවා ගොඩනගා තිබුණි. නමුත් බෞද්ධ ඥානවිභාගය හා සසඳන කල ඒවා කිසිදු වැදගත් කමක් නොමැති හුදු ප්‍රලාප වේ. එහෙයින් තත් පාරභෞතික ප්‍රශ්න හමුවේ බුදුසමය දක්වන ප්‍රතිචාරය වන්නේ නිහඬ බවයි. එම නිශ්ශබ්දතාව පිළිබඳ පරීක්ෂණාක්ෂිය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ එය සාමාන්‍ය නිශ්ශබ්දතාවක් වශයෙන් සලකා පසෙක දැමිය නො හැකි බව යි. බුදුසමයේ දී එය විශිෂ්ට ඥානවිභාගීය එළඹුමක් වන අතර පාරභෞතික ගැටලු විෂයෙහි විසඳුම් ඉදිරිපත් කිරීමේ සාර්ථක ම සන්නිවේදන උපක්‍රමය ද වේ.

උක්ත පාරභෞතික ප්‍රශ්න විෂයෙහි චින්තනය මෙහෙයවූ චූලමාලුංක්‍යපුත්ත භික්ෂුව ප්‍රකාශ කර සිටියේ බුදුරදුන් සිය ප්‍රශ්නවලට පිළිතුරු නො දුනහොත් තමන් උපැවිදි වන බවයි (මජ්ඣිමනිකාය 2, 2006:152). චූලමාලුංක්‍යපුත්ත භික්ෂුවට අමතර ව වච්ඡගොත්ත පරිබ්‍රාජකයා ද ඉහත සඳහන් පාරභෞතික ප්‍රශ්න බුදුරදුන්ගෙන් විමසා සිටියෙකි. ඔහු ද ප්‍රකාශ කර සිටියේ උක්ත සඳහන් ප්‍රශ්න විමසීමට පෙර යම් ප්‍රසාදයක් වූයේ නමුදු බුදුරදුන් එම ප්‍රශ්න පිළිනොගැනීම හේතුවෙන් දැන් එබඳු ප්‍රසාදයක් බුදුන් කෙරෙහි නො වන බවයි (මජ්ඣිමනිකාය 2, 2006:263). මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රශ්න විචාරක ශ්‍රාවකයින්ගේ ප්‍රතිචාරයන් කිසියම් අභියෝගාත්මක ස්වරූපයකින් මෙන් ඉදිරිපත් වී ඇති අතර පාරභෞතික ප්‍රශ්න සඳහා බුදුරදුන්ගෙන් පිළිතුරු සපයා ගැනීමේ දැඩි බලාපොරොත්තුවක් ඔවුන් සතු වූ බව යි. නමුත් උක්ත පාරභෞතික ප්‍රශ්න කෙරෙහි බුදුරදුන් සිය අව්‍යාකෘත ප්‍රතිපත්තිය කිසිඳු ලෙසකින්වත් වෙනස් නො කළහ. මේ අයුරින් විවිධ අවස්ථාවන්හි දී විවිධ ශ්‍රාවයන් විසින් ඉදිරිපත් කරන ලද විවිධාකාර වූ පාරභෞතික ප්‍රශ්න විෂයෙහි බුදුරජාණන් වහන්සේ දැක් වූ එක ම ප්‍රතිචාරය වූයේ අව්‍යාකෘත භාවය යි.

බුදුරජාණන් වහන්සේ පාරභෞතික ප්‍රශ්න විෂයයෙහි දැක්වූ අව්‍යාකෘත ප්‍රතිචාරයෙහි ඥානවිභාගාත්මක එළඹුම ඉස්මතු කොට ගැනීමේ දී ඥානවිභාගයේ මූලිකාංගයක් වූ සත්‍යය පිළිබඳ ව ද

යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය ය. දාර්ශනිකාංශයෙහි දී සත්‍යය යනු ඉතා වැදගත් සංකල්පයකි. නිවැරදි ඥානය ගොඩනැගීම ඥානවිභාගයෙහි කාර්යයක් වන බැවින් සත්‍යය පිළිබඳ ගවේෂණය ද ඥානවිභාගීය කාර්යයක් වශයෙන් හැඳින්විය හැකි ය. සාමාන්‍ය ව්‍යවහාරයේ දී 'සත්‍යය' වශයෙන් සැලකෙන්නේ කරුණුවල නිරවද්‍යතාව යි. නමුත් ඥානවිභාගයෙහි ස්වභාවය හා එහි සීමාවන් සළකා බැලීමේ දී කරුණු අතර නිවැරදි බව පමණක් යමක් සත්‍යය යැයි පිළිගැනීමට ප්‍රාමාණික නො වන බව කිව යුතු ය. භාෂාව ප්‍රස්තුතයන්ගේ අර්ථය සහ පූර්ණ සත්‍යය සන්නිවේදනය සඳහා යොදා ගැනීමේ දී භාෂාවෙහි දුර්වලතාව හා සීමාසහිත බව ප්‍රධාන ගැටලුවකි. එමෙන් ම එය සත්‍යය හා භාෂාව සම්බන්ධයෙන් මතුවන ඥානවිභාගාත්මක ගැටලුවකි. මෙම තත්ත්වය නිසා ම බටහිර දාර්ශනික ඉතිහාසයෙහි ප්‍රකට වූ ප්‍රධාන වාද සතරක් දැක ගත හැකි ය. අනුරූප්‍යතාවාදය, අනුසන්ධානවාදය, උපයෝගීතාවාදය සහ සත්‍යෙක්ෂණතාවාදය යනු එම වාදයන් ය.

ප්‍රස්තුතයන් මගින් ජනනය කරනු ලබන අදහස් කරුණු සමග අනුරූප වීම මගින් සත්‍යය ඉස්මතු කිරීමට උත්සාහ ගැනීම අනුරූප්‍යතාවාදයේ අරමුණ යි. අනුසන්ධාන යනු ගැළපීම යි. අවයවයන්ගේ ගැළපීම මගින් සත්‍යය ලබා ගැනීමේ ක්‍රමය අනුසන්ධානවාදයෙන් ප්‍රකට වේ. සත්‍යය සඳහා ඉදිරිපත් කරන විවිධ ඇගයුම් උපයෝගීතාව මත ම තීරණය කළ යුතු බව උපයෝගීතාවාදායෙන් ප්‍රකාශිත ය. සත්‍යෙක්ෂණතාවාදී අදහස් දැරූවන් පෙන්වා දෙන්නේ කිසියම් ප්‍රස්තුතයක් සත්‍යය වන්නේ එය ඉන්ද්‍රියානුසාරී ව සත්‍යෙක්ෂණය කළ හැකි නම් පමණක් බවයි.

කෙසේ වෙතත් බුදුසමය අවධාරණය කරන්නේ සත්‍යය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගත යුතු බව යි. අනුභූතියට ලක් කළ හැකි සත්‍යය බුදුසමයේ හඳුන්වා ඇත්තේ ආර්ය සත්‍යය වශයෙනි. ආර්යභාවය තුළ ඇත්තේ සත්‍යය පිළිබඳ විශ්වාසයක් හෝ ශ්‍රද්ධාවක් නො වේ. විශ්වයේ යථාර්ථය සවිඥාණික පිරීක්ෂණයකට භාජනය කරමින් යමක සත්‍යය නිර්ණය කිරීම එහි කාර්යභාරය යි. බුදුසමය සත්‍යයේ අන්තර්ගත විය යුතු නිසර්ග ලක්ෂණය වශයෙන් දක්වන්නේ ආර්යත්වයයි. එනිසා බුදුසමය පෙන්වා දෙන සත්‍යයයේ පදනම මනෝවිද්‍යාත්මක මෙන් ම ආචාරවිද්‍යාත්මක ද වේ. බුදුන්වහන්සේ අවධාරණය කරන ආර්ය

සත්‍යය අවබෝධ නො කිරීම හේතු කොටගෙන සත්ත්වයාට දීර්ඝ කාලයක් සසර සැරිසැරීමට සිදුවන බවත්, එය අවබෝධ කිරීමෙන් භව තෘෂ්ණාව නැති වන බවත් භව නෙත්තිය හා නැවත උපදීම ක්ෂය කළ හැකි බවත්ය (දීඝනිකාය 2, 2006:142). එ සේ ම ආර්ය සත්‍යයෙහි ලා විද්‍යමාන විය හැක්කේ සත්‍යයෙහි එක් ආකාරයකි. සත්‍යයෙහි බහුත්වයක් විද්‍යමාන නො වේ. යමක් අදානග්‍රාහීත්වයෙන් ගන්නා කල සත්‍යයේ විවිධතා මෙන් ම එක් දෙයක් සම්බන්ධයෙන් පවත්නා සත්‍යයයෙහි බහුත්වයක් ද දැකිය හැකි ය. එ නිසා බුදුරදුන් පාරභෞතික ප්‍රශ්න වශයෙන් උක්ත මතවාදයන් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ස්ථානෝචිත ව ය. ආර්ය සත්‍යය බුද්ධිය මෙහෙයවීමෙන් පමණක් උපදවා ගත නො හැකි ය. එය බුද්ධියෙහි හා අනුභූතියෙහි සුසංයෝගයකි.

බුදුරජාණන් වහන්සේ පාරභෞතික ප්‍රශ්න අව්‍යාකෘත කරනු ලබන්නේ කුමන පදනමකින් දැයි විමසීමේ දී ප්‍රමුඛ සාධකයක් වශයෙන් දැක්විය හැක්කේ තත් පාරභෞතික ප්‍රශ්න බුදුසමය අවධාරණය කරන ආර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමට අදාළ නො වීම යි. බටහිර දාර්ශනිකයන් විසින් යමක සත්‍යාසත්‍යතාව නිර්ණය කිරීම සඳහා ඉදිරිපත් කරන අනුරූපතාවය, අනුසන්ධානය, උපයෝගීතාවය සහ සත්‍යෝක්ෂණය යනාදී නිර්ණායකයන්ට වඩා බුදුන්වහන්සේ ඒ සඳහා ප්‍රායෝගික මිණුම්දඬු කිහිපයක් පෙන්වා දී ඇත. උන්වහන්සේ ලෝකය ශාස්වත ද? ආදී ප්‍රශ්න, අව්‍යාකෘත ඒවා වශයෙන් සැලකීමේ දී ඒවා පදනම් ලෙස හැඳින්විය හැකි ය. සූත්‍ර සාහිත්‍යයට අනුව එම නිර්ණායකයන් පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකි ය (දීඝනිකාය 1, 2006:414).

1. අර්ථය පිණිස හේතු නො වේ.
2. ධර්මය පිණිස හේතු නො වේ.
3. බ්‍රහ්මචර්යාව පිණිස හේතු නො වේ.
4. නිර්වේදය පිණිස හේතු නො වේ.
5. නිරෝධය පිණිස හේතු නො වේ.
6. ව්‍යුපසමය පිණිස හේතු නො වේ.
7. අභිඥානය පිණිස හේතු නො වේ.
8. අවබෝධය පිණිස හේතු නො වේ.
9. නිර්වාණය පිණිස හේතු නො වේ.

වශයෙනි. ප්‍රධාන වශයෙන් එම හේතු, ප්‍රමුඛ පදනම් දෙකක් මත රඳා පවතින බව පෙනේ. එනම් ආචාරවිද්‍යාත්මක හා ඥානමීමංසාත්මක හෙවත් ඥානවිභාගාත්මක යන පදනම් මතය. ඉහත දක්වා ඇති හේතු නවයෙන් මුල් හේතු හය ම ආචාරවිද්‍යාත්මක ය. අනෙක් හේතු තුන ඥානමීමංසාත්මක ය. මේ අනුව පාරභෞතික ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම, විග්‍රහ කිරීම, සාකච්ඡා කිරීම ආචාරවිද්‍යාත්මකව හෝ ඥානවිභාගාත්මක ව කැලැම නිෂ්ප්‍රයෝජන බව බුදුසමයේ ස්ථාවරය යි.

ඥානවිභාගයෙහි මුඛ්‍යතම අරමුණ වන්නේ සත්‍යෝක්ෂණය යි. ඒ සඳහා විවිධ ප්‍රමාණයන් අනුගමනය කර ඇති බව ඓතිහාසික නයින් පෙනේ. ප්‍රත්‍යක්ෂය, අනුමානය, උපමාන, ශාබ්ද ආදිය ඒ අතර වේ (බලදේවඋපාධ්‍යය 1999:215). විවිධ දර්ශනාන්තරයන්හි ඥානෝපායනයෙහි ලා ප්‍රකට උක්ත කිසිදු ප්‍රමාණයකින්වත් පාරභෞතික ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ගත නො හැකි ය. නමුත් යම් යම් භාරතීය චින්තකයින් මෙබඳු ප්‍රමාණයන් අනුගමනයෙන් ද උත්සාහ දරනු ලැබුවේ පාරභෞකිත වූ ප්‍රස්තුතයන් විෂයයෙහි පිළිතුරු සෙවීමට යි. පාරභෞතික ප්‍රස්තුතවලට උක්ත ක්‍රමවේද මගින් සපයා ගන්නා නිගමන ආවසානික නිගමන වශයෙන් බුදුසමය නො සලකන අතර ඒ සඳහා එක ම සහ සුදුසු ම ප්‍රතිකර්මය වශයෙන් දක්වන්නේ අව්‍යාකෘත කිරීම යි.

පාරභෞකිතවාදයෙන් ද (Metaphysics) තහවුරු කිරීමට උත්සාහ දරනු ලැබුවේ අතීන්ද්‍රිය වූ ප්‍රස්තුතයන් පිළිබඳ ඥානය යි. සමකාලීනව පැන නැගී තිබූ සියලු පාරභෞතික ප්‍රශ්න අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් තහවුරු කළ යුතු ඒවා වශයෙන් සලකා තිබූ බව කිව හැකි ය. බුදුරදුන්ගෙන් බොහෝ සමකාලීන පාරභෞකිතවාදීන් එබඳු ප්‍රශ්න විෂයයෙහි පිළිතුරු ලබා ගැනීමට උත්සාහ දරුවේ උන්වහන්සේ සාමාන්‍ය මිනිස් ඉඳුරන්ට ගෝචර නො වන විෂයයන් පිළිබඳ ව ද යම් යම් හෙළිදරව් කොට තිබූ ශාස්තෘවරයෙක් වශයෙන් ප්‍රසිද්ධ ව සිටි බැවින් යැයි ද කිව හැකි ය.

පාරභෞතික ගැටලුවලට බුදුරජාණන් වහන්සේ පිළිතුරු නො දුන්නේ ඒවා බුදුසමය ඉදිරිපත් කරන අරමුණුවලට අදාළ නො වන බැවිනැයි කිව හැකි ය. එ නිසා අව්‍යාකෘත ප්‍රතිපත්තියේ දී

උපයෝගීතාමය පදනමක් ද විද්‍යමාන වේ. යමෙකුට යමක් ගැටලුවක් වන්නේ එය පුද්ගලයාගේ දෛනික ජීවිතය හා සෘජු ව හෝ වක්‍ර ව කිසියම් බලපෑමක් එල්ල කරන්නේ නම් පමණි. කල්පිත නිර්මාණ තුළ දක්නට ලැබෙන්නේ සාමාන්‍ය මිනිස් ජීවිතය හා ඒවායෙහි කිසිදු සම්බන්ධතාවක් විද්‍යමාන නො වීමේ ලක්ෂණය යි. බුදුරජාණන් වහන්සේ අව්‍යාජ මෙන් ම ප්‍රායෝගික මිනිස් ගැටලුවලට විසඳුම් ඉදිරිපත් කිරීමට පසුබට නො වූ අතර මිනිස් ජීවිතයට අදාළ නො වන කරුණු සම්බන්ධයෙන් වෙහෙසීම නිරර්ථක වශයෙන් සැලකූහ. එනිසා බුද්ධ චරිතය පුරාම දිවෙන කේන්ද්‍රීය ලක්ෂණය වන්නේ මිනිසාට ගැටලු මතු වූ තැන, ඒවා විග්‍රහ කිරීමත් ඊට සාපේක්ෂ වූ ප්‍රායෝගික ක්‍රියාකලාපය පෙන්වා දීමත් ය. සූත්‍ර දේශනාවල මෙන් ම විනය පැනවීම්වල පසුබිම විමසා බැලීමේ දී එය මනාව පැහැදිලි වේ.

බුදුරජාණන් වහන්සේගේ විශ්වය පිළිබඳ අවබෝධ කරගත් සියලු ඥානය සන්නිවේදනය කිරීමට උත්සාහ නො ගත් අතර මිනිසාට අවශ්‍ය ඥානය පමණක් සන්නිවේදනය කිරීමට වගබලා ගත්හ. සිංසපා වනයේ දී බුදුරදුන් ආනන්ද හිමියන් අමතා කරන ප්‍රකාශයෙන් එය වඩාත් හොඳින් පැහැදිලි වේ (සංයුත්තනිකාය 5-2, 2006:294). ඒ අනුව මූලික මිනිස් ගැටලුවලට විසඳුම් ඉදිරිපත් කිරීමට තිබිය දී අනවශ්‍ය ගැටලු විෂයෙහි වෙහෙසීම නිෂ්ඵල කොට සැලකූ බුදුරජාණන් වහන්සේ සැබෑ ඥානවිභාගවාදියකු බව උන්වහන්සේ අනුගමනය කළ අව්‍යාකෘත ප්‍රතිපත්තිය මගින් පැහැදිලි වේ. ඥානවිභාගයෙන් අපේක්ෂා කරන්නේ විශ්වයේ සමස්තය පිළිබඳ ඥානය ගොඩනැගීම නො ව මිනිස් ජීවිතයට සම්බන්ධතාවක් දක්වන ප්‍රස්තුතයන් සම්බන්ධයෙන් පමණක් ඥානය විභාග කිරීම යි.

ඥානවිභාවාදියකුගේ ද ප්‍රමුඛ අභිප්‍රාය විය යුත්තේ නිවැරදි ඥානය ගොඩනැගීම යි. එසේ ම ඥානවිභාගය ඥානය ගොඩනැගීමටත් ගොඩනගනු ලබන ඥානයෙහි නිරවද්‍යතාව පරීක්ෂා කිරීමටත්, ඥානෝපායය හෙවත් නිවැරදි ඥානය ගොඩනැගිය හැකි මාර්ග සොයා ගැනීමටත් උත්සහ දරයි. එහි දී ඥානෝපායය යනු ඉතා වැදගත් කොට සැලකිය යුත්තකි. ප්‍රත්‍යක්ෂය, අනුමානය, උපමාන හා ශාබ්ද යනු භාරතීය දර්ශනාන්තරයන්හි ඥානය ගොඩනැගීම සඳහා භාවිත ප්‍රමාණයන් ය. ඒවා ඥානවිභාගයෙහි ලා ඥානෝපායයන්

වශයෙන් සැලකිය හැකි ය. පාරභෞතික ප්‍රශ්න මගින් අපේක්ෂිත යම් ඥානයක් වන්නේ නම් එය තහවුරු කිරීමෙහි ලා භාවිත කළ හැකි කිසිදු ඥානෝපායයක් විද්‍යමාන නො වේ. එනිසා පාරභෞතික ගැටලු හමුවේ බුදුරදුන් දක්වන ලද ප්‍රතිචාරය අනෙකුත් ශාස්තෘවරුන් ඉදිරිපත් කළ ප්‍රතිචාරයන්ට වඩා සාකලයායෙන් ම සාර්ථක ක්‍රමවේදයක් බව කිව හැකි ය. එය පාරභෞතික ප්‍රශ්න විෂයෙහි ඥනවිභාගීය වශයෙන් යෝග්‍යතම වූවකි.

ඥානය ලබා ගැනීමත්, ඥානය සන්නිවේදනය කිරීමත් එක හා සමාන වැදගත්කමක් උසුලන ඥානවිභාගීය අංශ දෙකකි. ඥානය සන්නිවේදනයේ දී ශ්‍රාවකයාගේ විශ්වාසය තහවුරු කිරීමට අපොහොසත් වීම එයින් අපේක්ෂිත ප්‍රතිඵල සාධනය වළකාලන ප්‍රමුඛ සාධකයකි. එම දුර්වලතාව බහුලව ඉස්මතු වන්නේ ඥානය සම්බන්ධයෙන් ඉදිරිපත් වන ප්‍රශ්න ආනුභූතික නො වන (භෞතිකත්වය ඉක්මවා ගිය) සාධක ඇසුරින් තහවුරු කරගැනීමට දරන උත්සාහයන්හි දී ය. සමකාලීන ව පැවැති බොහෝ ඥානමාර්ග ඵලදායී නො වූයේ ඒවා පාරභෞතික හෝ අධිභෞතික මතවාදයන් හි දැඩි ව එල්බගෙන සිටීම හේතුවෙනි. බුදුසමය එසේ නො වී ඥානය තහවුරු කිරීමෙහිත් ඥානය සන්නිවේදය කිරීමෙහිත් සාර්ථක වූයේ මිනිස් ජීවිතය හා බැඳුණු ප්‍රමුඛ ප්‍රස්තුතයන්ගෙන් පරිබාහිර ප්‍රස්තුත අදාළ කර නොගැනීම හේතුවෙනි. පාරභෞතික ප්‍රශ්න විෂයෙහි බුදුසමය ඉතා විශිෂ්ට ඥානවිභාගාත්මක විධික්‍රමයක් වූ අව්‍යාකෘත ක්‍රමය භාවිත කිරීමෙන් එය වඩාත් හොඳින් පැහැදිලි වේ.

සමකාලීන ඇතැම් චින්තකයින් විසින් පාරභෞතික ප්‍රශ්න විෂයයෙහි උත්සාහවත් වීමෙන් අපේක්ෂා කරනු ලැබුවේ ලෝකය සම්බන්ධයෙන් පරම සත්‍යය සන්නිවේදනය කර ගැනීමට යි. බාහිර ලෝකයක් පිළිබඳ වෙහෙසීම නිෂ්ඵල දෙයක් වශයෙන් සැලකූ බුදුසමය අභ්‍යන්තර ලෝකය හෙවත් පුද්ගලයා හා බැඳුණු ලෝකය පිළිබඳ පරම සත්‍යය පසක් කළ බව නො රහසකි. එම අභ්‍යන්තර ලෝකයේ ගතික ලක්ෂණය වන්නේ 'දුක' නමැති මනෝ මූලික ආවේගය යි. බුදුන්වහන්සේ එම දුක පිළිබඳ සත්‍යය අවබෝධ කිරීම පුද්ගලයාගේ ප්‍රමුඛ කාර්යය විය යුතු බවත් ඊට අදාළ නො වන සංකල්ප නිර්මාණය කොටගෙන ඒ තුළ චින්තනය මෙහෙයවීම අර්ථවිරහිත බවත් පෙන්වා දුන්හ. දුක පිළිබඳ සත්‍යය 'අරියසච්ච' යනුවෙන් විශේෂ කොට

හඳුන්වා ඇත්තේ සමකාලීන ව විවිධ දෘෂ්ටිගතිකයින් අනාර්ය වූ හීන වූ ග්‍රාම්‍ය වූ මනඃකල්පිතයන් ද සත්‍යය වශයෙන් ඉස්මතු කිරීමට උත්සාහ ගත් බැවින් යැයි සිතිය හැකි ය. පරම සත්‍යය හෙවත් ආර්ය සත්‍යය පාරභෞතික ප්‍රශ්න මගින් සන්නිවේදනය නො වන බැවින් බුදුසමය පාරභෞතික ප්‍රශ්න හමුවේ අව්‍යාකෘත වී ඇති බව පෙනේ.

සත්‍යය වශයෙන් යමක් හඳුනා ගැනීමේ දී එය පුද්ගලයාගේ ප්‍රත්‍යක්ෂයට ගෝචර වන්නක් විය යුතු ය. නමුත් පාරභෞතික ප්‍රශ්න මගින් ඉදිරිපත් කරනු ලබන සියලු ප්‍රශ්තුත ආනුභූතික ඒවා නො වේ. එබැවින් ඒවා ඥානවිභාගීය වැදගත්කමක් විද්‍යමාන නො කරන අතර ඒවා සත්‍යය හා සම්බන්ධතාවක් පෙන්නුම් නො කරයි. එ නිසා බුදුසමයේ අව්‍යාකෘත ප්‍රතිචාරය අතිශයින් ම ඥානවිභාගයෙහි ලා ඉතා වැදගත් ප්‍රවේශයක් වශයෙන් පෙන්වා දිය හැකි ය. ස්වකීය ප්‍රත්‍යක්ෂයට (දීඝනිකාය 2, 2006:143) ප්‍රමුඛස්ථානය දෙන බුදුසමය ඒ සඳහා කිසියම් හෝ බාධාවක් ඇති කරනසුලු සංකල්පවල එල්බ ගැනීමේ නිරර්ථකත්වය අවධාරණය කරයි.

බුදුරජාණන් වහන්සේ පාරභෞතික ගැටලු විෂයෙහි නිහඬ බව අගයන්නේ ඒවා පිළිතුරු නො දිය හැකි ප්‍රශ්න වශයෙන් සලකා නො ව පිළිතුරු නො දිය යුතු ප්‍රශ්න වශයෙන් සැලකීම හේතුවෙනි. උන්වහන්සේ සර්වඥවරයකු වශයෙන් සම්ප්‍රදාය මගින් හඳුනාගෙන තිබුණ ද මූලික බුද්ධ දේශනාවන්ට අනුව බුදුරදුන් තමන්වහන්සේව සර්වඥ යන ව්‍යවහාරයෙන් හඳුන්වා නො දුන් බව පැහැදිලි ය. තමන් ව හඳුන්වා දුන් ඉතා සුදුසු ම ව්‍යවහාරය වූයේ **බුද්ධ** යන්න යි. බුදුරජාණන් වහන්සේට අවශ්‍ය වූයේ ලෝකයේ ඇතිතාක් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම නො ව පුද්ගලයාට අත්විඳීමට සිදුවන ප්‍රධාන සහ ප්‍රබලතම ගැටලුව වූ දුක නමැති ගැටලුවට විසඳුම් සෙවීම යි. එ නිසා උක්ත අරමුණ සාධනය කිරීම සඳහා අවශ්‍ය දැනුමෙන් හා අවබෝධයෙන් පරිපූර්ණ ශාස්තෘවරයකු වශයෙන් බුදුරදුන් හඳුනාගැනීම වඩාත් සුදුසු ය. පාරභෞතික ප්‍රශ්න විෂයෙහි පිළිතුරු නො දීම උන්වහන්සේගේ බුද්ධ ඥානය පිළිබඳ විමතියක් හෝ සැකයක් ඇති කරගැනීමට හේතුවක් නො වන බව ද කිව යුතු ය. පරීක්ෂාවෙන් බැලූ විට පෙනී යන්නේ පාරභෞතික ප්‍රශ්න සඳහා පිළිතුරු නො දීම බුදුරදුන්ගේ අවබෝධයේ ඌනතාවක් නො ව ඥානවිභාගීය උපක්‍රමයක් බවයි. බුදුන්වහන්සේගේ අවබෝධය ස්වයං ආනුභූතියක්

වූ බැවින් උන්වහන්සේ ශ්‍රාවකයා නොමග යනසුලු ඥානෝපායයන් නිර්දේශ කිරීමෙන් වැළකී සිටි බව කිව හැකි ය.

පාරභෞතික ගැටලු හමුවේ බුදුරජාණන් වහන්සේගේ ඥානවිභාගීය උපාය කෞෂල්‍ය ප්‍රකට වන්නේ භාෂා භාවිතයෙහි යෝග්‍යතාව පිළිබඳ උන්වහන්සේ තුළ පැවැති ස්ථානෝචිත විශාරදත්වය දෙස බැලීමෙනි. පාරභෞතික ගැටලු විෂයයෙහි අව්‍යාකෘතභාවය හැර අනුශ්‍රවය, තර්කය, අධිකාරය හෝ අනුමානය ආදි කිසිදු මාර්ගයෙකින් ඒ සඳහා පිළිතුරු සැපයීමට බුදුරදුන් ඉදිරිපත් නො වූයේ එ මගින් කිසිදු ඥානවිභාගීය කාර්යසාඵල්‍යයක් සිද්ධ නො වන බැවිනි. පිළිතුරු සපයා ගැනීමට උත්සාහ ගැනීම හුදෙක් දෘෂ්ටිග්‍රහණයක් පමණකි. එය ශාස්වත හෝ උච්ඡේද යන දෘෂ්ටිවලින් එකක් වේ. දෘෂ්ටි ජනනය කරවනසුලු පාරභෞතික කාල්පනික කරුණු ගැන සාකච්ඡා කිරීම බෞද්ධ ඥානවිභාගයට පටහැණි වූවකි. දෘෂ්ටි ප්‍රහාණය බෞද්ධ ඥානවිභාගයේ ප්‍රධාන අරමුණ යි. එබැවින් පාරභෞතික ප්‍රශ්න විෂයයෙහි බුදුදහම යෝජනා කරන අව්‍යාකෘත ප්‍රතිපත්තිය බෞද්ධ ඥානවිභාගයේ තත් අරමුණ සඳහා කේන්ද්‍රගත වී ඇතැයි කිව හැකි ය.

අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයෙහි ප්‍රශ්න විසර්ජනීය ක්‍රම සතරක් පෙන්වා දී තිබේ. එනම්;

1. ඒකංස ව්‍යාකරණ
2. විභජ්ජ ව්‍යාකරණ
3. පටිපුච්ඡා ව්‍යාකරණ
4. ඨපනීය (අංගුත්තරනිකාය 1, 2006:352)

වශයෙනි. මෙහි සඳහන් ඨපනීය යන්නෙන්, බැහැර කළයුතු, ඉවත් කළයුතු ආදී අරුත් ගම්‍ය කෙරේ. එමගින් ද ප්‍රකට වන්නේ අව්‍යාකෘතභාවය යි. ඒවා විග්‍රහ කිරීම අර්ථසම්පන්න නො වේ. යමක් අර්ථසම්පන්න වීමට නම් කිසියම් අකාරයකින් හෝ එහි සත්‍ය අසත්‍යතාව පරික්ෂා කර බැලිය හැකි ක්‍රමයක් තිබිය යුතු ය. පාරභෞතික ප්‍රශ්න එසේ නො වන හෙයින් බෞද්ධ ඥානවිභාගයේ දී ඒවා ඨපනීය වශයෙන් සලකා තිබේ.

බෞද්ධ ඥානවිභාගයේ විශේෂත්වයක් වන්නේ සත්ත්වයාගේ මූලික ගැටලු කෙරෙහි අවධානය යොමු කොට තිබීම යි. පාරභෞතික

ප්‍රශ්න කෙරෙහි අව්‍යාකෘත වීම මගින් සන්නිවේදනය වන අනෙක් කරුණ වන්නේ මිනිස් ජීවිතය හා සබැඳි මූලික ගැටලුවලට ප්‍රමුඛත්වය ලබා දීම යි. ප්‍රායෝගිකත්වයට හා සම්බෝධියට අදාළ ඥානය සන්නිවේදනය කිරීමට බෞද්ධ ඥානවිභාගය පසු බට නො වේ. යම් විෂ පෙවූ ඊතලයක් වැදුණු පුද්ගලයකු මූලික වශයෙන් වෙහෙසිය යුත්තේ හැකි ඉක්මනින් එම ඊය ගලවා දමා ප්‍රතිකාර කිරීමට යි. එසේ තිබිය දී එම ඊය ආවේ කොහෙන් ද? එය විද්දේ කවුරුන් විසින් ද? එය සාදා ඇති ලෝහය කුමන වර්ගයේ ද ආදි ප්‍රස්තුතයට අදාළ නො වන වෙනත් කාරණා ගැන වෙහෙසීම අනවශ්‍ය ය. අවශ්‍ය වන්නේ ඉක්මන් ප්‍රතිකාරය යි. එ සේ ම එමගින් සුවය ලැබීමයි (මජ්ඣිමනිකාය 2, 2006:152). පාරභෞතික ප්‍රශ්න විෂයයෙහි බෞද්ධ ඥානවිභාගීය ප්‍රතිචාරයෙහි විමසා බැලීමේ දී ඒ සඳහා මූලික වූ පදනම මනාව පැහැදිලි ය. බට කැලයකට වැදුණු ඇතකු එම බට කැලය විනාශ කරන්නාක් මෙන් මිනිසා විසින් දුක්ඛ නිරෝධය සඳහා අප්‍රමාදී ව කටයුතු කළ යුතු ය (සංයුත්තනිකාය 1, 2006:278). පාරභෞතික ප්‍රශ්න දුක්ඛ නිරෝධයට අවශ්‍ය මානසික පසුබිම අහුරා දමන බැවිනුත් ඒ සඳහා ඇති අධ්‍යාත්ම වීර්යයය ප්‍රමාද කරන බැවිනුත් ඒවා අව්‍යාකෘත කළ බව සිතිය හැකි ය. නිවැරදි ඥානය තහවුරු කරගැනීමට අදාළ නො වන ඥානවිභාගීය කරුණු ගැන විග්‍රහ කිරීම, විභාග කිරීම, සන්නිවේදනය කිරීම, බෞද්ධ ඥානවිභාගයෙන් අනුමත නො කෙරෙයි. එයට හේතුව, ඥාන විභාගයෙන් අපේක්ෂිත අරමුණු සාධනය එයින් සිදු නො වන හෙයිනි.

ලෝකය සාස්වත ද? අසාස්වත ද? ආදී ප්‍රශ්න මිනිස් සිත මැඬ පවත්නේ අවිද්‍යාව හේතු කොටගෙන ය. අවිද්‍යාව ප්‍රත්‍යය වීමෙන් සංස්කාර හට ගනියි. යමක් පිළිබඳ දැනුම රැස් කිරීම ද සංස්කාරයකි. බුදුසමය සියලු සංස්කාරයන්ගෙන් වෙන්වීම හෙවත් නෙක්කම්මය අගය කරයි. එය තෘෂ්ණාව, ද්වේශය සහ මෝහය දුරු කිරීමට මාර්ගය ද වේ. එය ම නිරෝධය යි. එය ම නිවන යි (ඛුද්දකනිකාය පටිසම්භිදාමග්ගපකරණ, 2006:141). බුද්ධ දේශනාවෙන් සමර්ථනය කෙරෙන විමුක්තියෙන් හෙවත් නිවනෙන් අදහස් වන්නේ ඥානවිභාගීය නිදහස යි. බුදුරජාණන් වහන්සේ පාරභෞතික ප්‍රශ්න සඳහා ඔව් හෝ නෑ යනුවෙන් ප්‍රතිචාර දැක්වී නම් එය ඥානවිභාගීය නිදහස සමර්ථනය කිරීමට බාධාවකි. එය දෘෂ්ටි කාන්තාරයක සිරගත වීමක් බවට පත් වේ.

පාරභෞතික ප්‍රශ්න හමුවේ බුදුසමය අව්‍යාකෘත වීම බෞද්ධ ඥානවිභාගයේ ප්‍රායෝගික චරණය ද අර්ථවත් කර දැක්වීමකි. ඒවා හමුවේ බුදුරජාණන් වහන්සේ ව්‍යාකෘත වූයේ නම් අනිවාර්යයෙන් ම කාමසුඛල්ලිකානුයෝගය හෝ අත්තකිලමතානුයෝගය යන දෘෂ්ටීන්හි ප්‍රායෝගික රංගනය නිසර්ගයෙන් ම වැලඳ ගැනීමක් බවට ද පත් වේ. එහෙයින් අව්‍යාකෘතභාවයෙන් ප්‍රකට වන්නේ අන් කිසිවක් නො ව බුද්ධ දේශනාවට ම අනන්‍ය වූ දාර්ශනික මධ්‍යම ප්‍රතිපදාව යි. බෞද්ධ ඥානවිභාගය ඵලදායී වීමට වඩාත් ඉවහල් වූයේ මෙම දාර්ශනික මධ්‍යම ප්‍රතිපදාව යයි කීම සාවද්‍ය නො වේ. බුද්ධ දේශනාව අනෙකුත් සමයවාදයන්ගෙන් වෙනස් වන්නේ ද මෙම සුවිශේෂී ලක්ෂණය නිසා ය. මෙ නයින් බලන කල අව්‍යාකෘත ප්‍රතිචාරය බුදුසමයට ම අනන්‍ය වූ සංක්ෂිප්ත ඥානමාර්ගය යි. මෙබඳු ඥානමාර්ගයක් වෙනත් කිසිදු සම්ප්‍රදායකින් ප්‍රකට ව ඉදිරිපත් වී ඇතැයි කිව නො හැකි ය. මෙහි දී අදහස් කරන්නේ ප්‍රශ්න හමුවේ නිහඬ බව නො ව එය ඥානවිභාගාත්මක නිහඬබවක් වීමේ අවශ්‍යතාව යි. සැබැවින් ම පාරභෞතික වූ සෑම ගැටලුවක් ම සාමාන්‍ය මිනිස් ප්‍රත්‍යක්ෂය ඉක්මවා ගිය ඒවා ය. එ නිසා ඒවා අව්‍යාකෘත කිරීම හැර වෙනත් කිසිදු ඥානවිභාගාත්මක ක්‍රමවේදයක් අදාළ නො වන බව බුදුරජාණන් වහන්සේ මනාව දැන සිටියහ.

ඥානවිභාගීය නිදහස (නිවන) ලබාගත් කිසිවෙකුටත් පාරභෞතික ස්වරූපයේ ගැටලු ඇති වූ බවක් ත්‍රිපිටක සාහිත්‍යයෙහි සඳහන් නො වේ. එබඳු ප්‍රශ්න පිළිබඳ බුදුරදුන්ගෙන් විමසූ සියල්ලෝ ම ඥානවිභාගාත්මක නිදහස අත්පත් කරගත්තෝ නො වූහ. එබැවින් පාරභෞතික ප්‍රශ්න විමසූ බොහෝ දෙනා දෘෂ්ටිගතිකයෝ වූහ. දෘෂ්ටි විචාරය හෝ දෘෂ්ටි ප්‍රතිබාහනය බුදුසමයට ආගන්තුක වූවක් නො වේ. එය න්‍යායාත්මකව යොදා ගත් අයුරු ද සූත්‍ර දේශනාවන්ගෙන් සුප්‍රකට වේ. නමුත් දෘෂ්ටි පරාමර්ෂකයින් විෂයයෙහි බුදුරජාණන් වහන්සේ යොදා ගත් න්‍යායාත්මක දෘෂ්ටි ප්‍රතිබාහන ක්‍රමවේදය වූයේ නිහඬ බවයි.

පාරභෞතික වශයෙන් සැලකෙන ප්‍රස්තුත බුදුරජාණන් වහන්සේ අව්‍යාකෘත කළ යුතු සංවාදවල දී පමණක් අව්‍යාකෘත ස්වරූපයෙන් තැබීමට උත්සාහ ගෙන තිබේ. හටගත් වාදවලට, වාද දෘෂ්ටි ඇති පුද්ගලයන් වෙත බුද්ධාදී උතුමන් නො එළඹෙන බව ද ප්‍රකාශිතය

(ඛුද්දකනිකාය 2, 2006:780). නමුත් යමෙක් දැනගැනීමේ අවංක චේතනාවෙන් කරුණු විමසූ විට ඒවා විග්‍රහ කොට ඇති අවස්ථාවන් ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වේ. එනිසා දෘෂ්ටි ජනනය වන සුළු සංවාදවල දී පමණක් තත් ප්‍රස්තුත අව්‍යාකෘත කිරීමෙන් පැහැදිලි වන්නේ සන්නිවේදනයෙහි ලා න්‍යායාත්මක එළඹුමකි. එය අව්‍යාකෘත න්‍යායය වශයෙන් හැඳින්වීම සුදුසු ය. පාරභෞතික ප්‍රශ්න කෙරෙහි බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිචාරය දෘෂ්ටි ප්‍රතිබාහනය විෂයයෙහි ද බෙහෙවින් භාවිත කොට තිබේ.

සන්නිවේදනයෙහි ලා ප්‍රධාන මාධ්‍ය දෙකක් විද්‍යමාන ය. වාචික සන්නිවේදනය හා අවාචික සන්නිවේදනය යනුවෙනි. අවාචික සන්නිවේදනයේ ප්‍රධාන මාධ්‍යය වන්නේ අභිනය යි. අභිනයෙන් ඉදිරිපත් කරනු ලබන ඉන්ද්‍රියානුභූති අත්දැකීම් සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදයට වඩා අතිෂය සියුම් අවාචික සන්නිවේදන ක්‍රමයක් අව්‍යාකෘත හෙවත් ඨපනීය ක්‍රමයෙන් ප්‍රකට කර තිබේ. එ නිසා අව්‍යාකෘතභාවය අවාචික සන්නිවේදන න්‍යායයක් වශයෙන් ද තව දුරටත් විග්‍රහ කළ හැකි ය. න්‍යායය යන්නෙන් 'අර්ථයකට පැමිණවීම්' යන්න ගම්‍ය වේ. නිර්වාණය හෝ ඒ පිණිස පවත්නා පිළිවෙත යනාදී අර්ථ ද එයින් ප්‍රකාශ වේ (ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය 1956:555). එහෙයින් න්‍යායයෙන් ප්‍රකට අරමුණු ද අව්‍යාකෘත ප්‍රතිචාරයෙන් සාධනය වී ඇති බව කිව හැකි ය.

එපමණක් නො ව පාරභෞතික ප්‍රශ්න විෂයෙහි බුදුන් වහන්සේ දක්වා ඇති ප්‍රතිචාරයෙන් බුදුසමයේ දාර්ශනික චින්තාව ද අර්ථවත් වේ. ඒවා හමුවේ බුදුන් වහන්සේ නිහඬ වීම මගින් ශාස්වතවාදයත් උච්ඡේදවාදයත් යන ප්‍රධාන දෘෂ්ටි දෙක ම නිශේධනය කොට තිබේ. බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් හැට දෙකක් පමණ වූ දෘෂ්ටි මෙම ප්‍රධාන සංකල්ප දෙක යටතේ සංග්‍රහ වන අතර පාරභෞතික ප්‍රශ්න තුළ ද එම ප්‍රධාන දෘෂ්ටි මූලයන් නියෝජනය වී ඇත. මෙම ද්විප්‍රකාර දෘෂ්ටීන් බුදුසමය සාවද්‍ය ඒවා වශයෙන් බැහැර කරන්නේ ඥානවිභාගයේ දාර්ශනික හරය ප්‍රකට කරමිනි. එනිසා පාරභෞතික ප්‍රශ්න හමුවේ දැක්වූ අව්‍යාකෘත ප්‍රතිචාරය වනාහි බුදුරදුන් බ්‍රහ්මජාල සූත්‍රයේ දී ඉදිරිපත් කළ ඥානවිභාවිභාගාත්මක දෘෂ්ටිවිචාරය හා දෘෂ්ටි ප්‍රතිබාහනය ඉතා සියුම් ලෙසත්, සංක්ෂේපයෙනුත්, න්‍යායයාත්මකවත් ප්‍රකට කිරීමක් සේ හඳුන්වා දිය හැකි ය.

බුදුරජාණන් වහන්සේ කාලාම සූත්‍රයේ දී සමකාලීන සමාජයේ ප්‍රචලිතව පැවැති ඥානමාර්ග දහයක් එකහෙළා ම ප්‍රතික්ෂේප කළහ. යමක සත්‍ය අසත්‍යාව පිළිබඳ ඥානය තහවුරු කරගැනීමේ දී ස්වකීය ප්‍රත්‍යක්ෂය ප්‍රමාණික වශයෙන් දක්වා තිබේ (අංගුත්තරනිකාය 1, 2006:336). එනිසා අව්‍යාකෘත න්‍යායය මගින් ශ්‍රාවකයා ස්වයං යථාර්ථයකට පැමිණවීමට උත්සාහ ගෙන ඇත. විවිධ හේතූන් පදනම් කොටගෙන අධිභෞතික ප්‍රශ්න හමුවේ පිළිතුරු දීමෙන් වැළකී සිටි ශ්‍රමණයන් අතරට සංභයවාදීහු ද ඇතුළත් වේ. සංශයවාදීන්ගේ න්‍යාය වූයේ ද පිළිතුරු දීමෙන් වැළකී සිටීම යි. නමුත් බුදුසමයේ එන අව්‍යාකෘත ක්‍රමය සංශයවාදීන්ගේ ප්‍රශ්න හමුවේ නිරුත්තර වීමේ ක්‍රමයට වඩා හාත්පසින් ම වෙනස් මුහුණුවරක් ගනියි. සංශයවාදීන්ගේ නිරුත්තර වීම සැකය මත පදනම් ව සිදු වූ අතර බුදුරදුන් ඥානවිභාගාත්මක පදනමක් මත අව්‍යාකෘත ක්‍රමය අනුගමනය කොට ඇති බව කිව හැකි ය (දීඝනිකාය ස, 2006:413).

අචින්තනීය ධර්මයන්හි සංග්‍රහ වී ඇත්තේ ද දස අව්‍යාකෘත ප්‍රශ්න මගින් අපේක්ෂිත පාරභෞතික අදහස්වලට සමාන තත්ත්වයෙහි ලා ගිණිය හැකි අදහස් සමුදායකි. සත්ත්ව විෂය, ලෝක විෂය, කර්ම විෂය සහ බුද්ධ විෂය යනු අචින්තනීය ධර්මයන් ය. එ මගින් අදහස් කොට ඇත්තේ ඒ පිළිබඳ සිතීම අසීමාන්තික විය හැකි බවයි. එ නිසා එ බඳු විෂයයන් පිළිබඳ අනුගමනය කළ යුතු බුද්ධිමය පියවර වන්නේ ඒවා පිළිබඳ නොසිතා සිටීම ය. හෙවත් අසීමාන්තික ව ඒ වෙනුවෙන් චින්තනය නො යෙදවීම ය.

බුදුසමය විශ්වගත සමස්තය පිළිබඳ අවධානය යොමු කිරීම වෙනුවට ආභ්‍යන්තරික ලෝකය අවබෝධය කරගැනීම නිර්දේශ කරයි (සංයුත්තනිකාය 1, 2006:120). බඹයක් පමණ වූ ශරීරය තුළ ම ලෝක සමුදයත්, ලෝක නිරෝධයක් ප්‍රතීයමාන වන බව බුදුරජාණන් වහන්සේ වදාලේ එහෙයිනි. එනිසා බුදුසමයාගත අව්‍යාකෘත ප්‍රතිචාරය ශ්‍රාවකයා යථාර්ථයට පැමිණවීට අනුදත් අභිප්‍රේරණ මූගධර්මයක් වශයෙන් ද පෙන්වා දිය හැකි ය.

## නිගමනය

උක්ත කරුණු පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ සමකාලීන දාර්ශනිකයන් විසින් ආත්මය, පුනර්ජන්මය, කර්මය, විශ්ව නිර්මාණය

හා විමුක්තිය වැනි ප්‍රස්තුත දෘෂ්ටාන්තයන් වශයෙන් ග්‍රහණය කොටගෙන සිටි බව යි. බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කළ අව්‍යාකෘත ක්‍රමය නිසා පසුකාලීන පඬිවරුන් විසින් උන්වහන්සේ ව විවිධාකාරයෙන් හඳුන්වා ඇත. කීත් විසින් උන්වහන්සේ ආඥෙයවාදියකු ලෙසත්, රාධාක්‍රිෂ්ණන් විසින් ගූඪවාදියකු ලෙසත්, ඕගන් විසින් උපයෝගිතාවාදියකු ලෙසත්, කුමාරස්වාමි විසින් සම්ප්‍රදායවාදියකු ලෙසත්, ඕල්ඩන්බර්ග් විසින් සම්ප්‍රදාය විරෝධියකු ලෙසත් හඳුන්වා දී ඇත. බුදුරජාණන් වහන්සේගේ දාර්ශනික අදහස් ගැඹුරින් පරීක්ෂා කර බැලීමේ දී පැහැදිලි වන්නේ ඒ සෑම දේශනාවක් ම මෙ බඳු පාරභෞතික ප්‍රශ්න මගින් යටපත් කර තිබූ යථාර්ථවාදී දර්ශනය නැවත ඉස්මතු කිරීමට ගත් උත්සාහයක් බවයි. පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණය, මධ්‍ය මාර්ගය හා චතුරාර්‍ය සත්‍යය වැනි දාර්ශනික සිද්ධාන්ත මගින් එම කාර්යය යථාර්ථයක් බවට පත් කළ අයුරු විවිධ දේශනා මගින් පැහැදිලි වේ. එනිසා පාරභෞතික ප්‍රස්තුත විෂයයෙහි බුදුසමය ඉදිරිපත් කොට ඇති අව්‍යකෘත ප්‍රතිචාරය අංශ කිහිපයකින් ම ඇගයීමට ලක්වන බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


අංගුත්තරනිකාය 1 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

අංගුත්තරනිකාය 2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

අංගුත්තරනිකාය 3 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

අංගුත්තරනිකාය 4 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

අංගුත්තරනිකාය 5 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

අංගුත්තරනිකාය 6 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

ඛුද්දකනිකාය 2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

දීඝනිකාය 1 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

දීඝනිකාය 2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

දීඝනිකාය 3 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

මජ්ඣිමනිකාය 1 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

මජ්ඣිමනිකාය 2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

මජ්ඣිමනිකාය 3 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

සංයුත්තනිකාය 1 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

සංයුත්තනිකාය 2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

සංයුත්තනිකාය 3 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

සංයුත්තනිකාය 4 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

සංයුත්තනිකාය 5-1 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

සංයුත්තනිකාය 5-2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (2006) ලංකා බෞද්ධ මණ්ඩලය (සංස්) කොළඹ.

## ද්විතීයික මූලාශ්‍රය

අබේනායක, ඔලිවර් (2009) *බෞද්ධ අධ්‍යයන විමර්ශන*, පඤ්ඤාරතන හිමි, මහමිතව සහ තවත් අය (සංස්) කොළඹ, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

*බලදේව උපාධ්‍යායගේ භාරතීය දර්ශන* (1999) පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (පරි) කොළඹ, ඇස් ගොඩගේ සහෝදරයෝ.

විජේබන්ඩාර, චන්ද්‍රිම සහ මොරටුවගම, එච්.එම් (1995) *ආදි බෞද්ධ චින්තනය*, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

## ශබ්දකෝෂ

*ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය* (1956) සෝරත හිමි, වැලිවිටියේ, (සංස්) අභය ප්‍රකාශකයෝ.

## English (Secondary Sourses)


Chakma, S. R. (2017). An explanation to the Buddha's unanswered questions. *The Journal of International Buddhist Studies College (JIBSC)*, *3*(1), 1-20.

Jayatilleke, K. N. (2013). *Early Buddhist theory of knowledge*. Routledge.

Karunadasa, Y. (2007). The unanswered questions: Why were they unanswered? A re-examination of the textual data.

Nicholson, H. (2012). The unanswered questions and the limits of knowledge. *Journal of Indian Philosophy*, *40*, 533-552.

Organ, T. W. (1954). The Silence of the Buddha. *Philosophy East and West*, *4*(2), 125–140. https://doi.org/10.2307/1397523

Siderits, M. (2021). *How things are: An introduction to Buddhist metaphysics*. Oxford University Press.